## 2 වන වර්ෂය

# විෂය නිර්දේශය

## විෂය මාලාව

1. සිංහල
2. පාලි
3. සංස්කෘත
4. ත්‍රිපිටක ධර්මය
5. ඉංග්‍රීසි
6. ගණිතය

යන අනිවාර්ය විෂයයන් පමණි.

### 1. සිංහල (2 වර්ෂය)

1. **අභිමතාර්ථ**

1.1 ශ්‍රවණය, කථනය, කියවීම හා ලිවීම යන භාෂා හැකියාවන් වර්ධනය කිරීම.

1.2 සිංහල භාෂාවේ ව්‍යාකරණය පිළිබඳ දැනීම දියුණු කිරීම.

1.3 සිංහල භාෂාවේ ලක්ෂ්‍යාර්ථ, වාච්‍යාර්ථ, ව්‍යඞ්ග්‍යාර්ථ රූඪි අර්ථ ආදි අර්ථ භේදයන් වටහා ගැනීම.

1.4 අර්ථාවබෝධය හා රචනා කෞශල්‍යය දියුණු කිරීම.

1.5 සන්නිවේදනය සඳහා භාෂාව යොදාගැනීමේ හැකියාව දියුණු කිරීම.

1.6 භාෂා සම්ප්‍රදාය හැඳින ගැනීම.

1.7 රසාස්වාදය.

2. **විෂය කරුණු**

2.1 අක්ෂර – අක්ෂර ප්‍රභේද, අක්ෂර වින්‍යාසය

2.2 නාමපද – ප්‍රභේද – ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා
සර්වනාම – ප්‍රශ්න වාචක සර්වනාම, පෞරුෂ සර්වනාම,
නාම විභක්ති – ප්‍රථමා කර්ම, කර්තෘ හා කරණ විභක්ති.
අර්ථ ප්‍රභේද – විරුද්ධාර්ථ, සමානාර්ථ, බහ්වර්ථ

2.3 නිපාත – සමුච්චයාර්ථ, ප්‍රශ්නාර්ථ, භේදාර්ථ ක්‍රියාන්වය, කාලවාචක.

2.4 උපසර්ග
2.5 ආඛ්‍යාත පද – විධික්‍රියා
2.6 නෛපාතික කෘදන්ත – පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
2.7 උක්තාඛ්‍යාත යෝගය.
2.8 කාරක – කර්තෘ කාරක, කර්ම කාරක, භාවකාරක.
2.9 සංග්‍රහ වාක්‍ය.
2.10 රචනය, සාරාංශකරණය, අර්ථාවබෝධය.
2.11 ව්‍යවහාරය – රාජකාරි ලියුම්, ආරාධනා පත්‍ර, දැන්වීම්, විදුලි පුවත්.

3. නිර්දිෂ්ට ග්‍රන්ථ

3.1 සිංහල 2 – මූලික පිරිවෙන – අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
3.2 සුභාෂිතය – (සම්පූර්ණ පොත)
3.3 කථා මෘතය – පූජ්‍ය වැලිවිටියේ සෝරත නාහිමි.
3.4 රෝහිණී – මාර්ටින් වික්‍රමසිංහ
3.5 වදන් කවිපොත සහ ගණදෙවි හැල්ල.

## 2. පාළි (2 වර්ෂය)

1. අභිමතාර්ථ

1.1 ශ්‍රවණය, කථනය හා කියවීම, ලිවීම යන භාෂා හැකියාවන් වර්ධනය කිරීම.

1.2 පාළි භාෂාවේ ව්‍යාකරණය පිළිබඳ දැනීමක් ලබාදීම.

1.3 පාළි භාෂාවෙන් සිංහල භාෂාවටත්, සිංහල භාෂාවෙන් පාළි භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව දියුණු කිරීම.

1.4 ග්‍රන්ථාගත පාළි සූත්‍ර පාඨාදිය ධාරණය.

2. විෂය කරුණු

2.1 අක්ෂර මාලාව

ප්‍රභේද – (i) ස්වර – හස්ව, දීර්ඝ, ද්විස්වභාව

(ii) ව්‍යඤ්ජන – වර්ගාක්ෂර, මහාප්‍රාණ, අල්පප්‍රාණ, ඝෝෂ, අඝෝෂ, අනුනාසික, නිග්‍රහීත.

ආර්.ජී. විමල් ප්‍රේමතිලක